Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 12

විෂය:- **නාට්‍ය හා රංග කලාව**

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

**නිපුණතා මට්ටම - අභිරූපනය ඉදිරිපත් කරයි.**

**ක්‍රියාකාරකම - අභිරූපනය යන්නෙහි අර්ථය නිරූපණය කිරීම සහ අභිරූපනය මගින් අත්දැකීම් ඉදිරිපත් කිරීම.**



**අභිරූපනය යනුවෙන් හැඳින්වෙන්නේ ආංගික අභිනය මූලික කරගෙන වාචිකාභිනය තොරව යම් කිසි සිද්ධියක් හෝ ක්‍රියාකාරකමක් නිර්මාණශීලීව රඟ දක්වා පෙන්වීමයි.**සාත්වික අභිනය ද මේ සඳහා යොදා ගනු ලබන අතර ප්‍රමුඛ වන්නේ ආංගික අභිනයයි.ශිල්පියා කිසිදු විටෙක සැබෑ ලෝකයේ ද්‍රව්‍ය පරිහරණය කරමින් රංගනය නොකරන අතර හිස් අවකාශය තුල ද්‍රව්‍යයන්හි හැඩය, බර, ප්‍රමාණය පැහැදිලිව මවා පායි.අභිරූපන ශිල්පියා කිසියම් අවස්ථාවක් හෝ සිදුවීමක් සම්බන්ධ ක්‍රියා පද්ධතිය අංගහාර සහ ඉරියව් භාවිතා කරමින් ඉදිරිපත් කරන අතර ඒ තුළ කිසියම් ගැටුමක් සහිත ක්‍රියාකාරීත්වයක් ගොඩ නැගෙන අයුරින් ද අභිරූපනය රංගයක් නිර්මාණය කළ යුතු වේ .

**උදා-: ළමයා සරුංගලයක් යවනවා පමණක් ප්‍රමාණවත් නැත ඒ හා බැඳුණු යම් නිර්මාණාත්මක ක්‍රියාවලියක් නිරූපණය වන සේ අභිරූපනය ගොඩනැගිය යුතුයි.**

අභිරූපන රංගනයන් කේවල ඉදිරිපත් කිරීම හා සමූහික ඉදිරිපත් කිරීම් වශයෙන් දෙයාකාරයෙන්ම ඉදිරිපත් කරයි .

අභිරූපන රංගයක් නිර්මාණය කිරීමේ දී යොදා ගනු ලබන ශිල්ප ක්‍රම දෙයාකාරයකි.

- අභ්‍යාන්තර ශිල්ප ක්‍රම
- බාහිර ශිල්ප ක්‍රම

**අභ්‍යාන්තර ශිල්ප ක්‍රම යනු** අභිරූපන රංගනය ට අදාළ කරගත් සිද්ධියේ අවස්ථාවන් පිළිබඳ ව ඉතා සියුම් මනසින් මෙනෙහි කිරීම යි.

**බාහිර ශිල්ප ක්‍රම යනු** මනසින් නිර්මාණය කරගත් සිද්ධිය සිරුර උපයෝගී කරගෙන ඉදිරිපත් කිරීමයි .

අභිරූපන රංගයක් නිර්මාණය කර ගැනීමේදී විශේෂයෙන්ම මිනිස් සිරුර භාවිතය තුළින් විවිධ දේ මවා පෑමට හැකි ආකාරයේ අවස්ථාවන් හා සිදුවීම් තෝරාගත යුතුයි තෝරා ගත යුතුය.අභිරූපන රංගයක් තාත්විකත්වය ඉක්මවූ අධි රංගන ස්වභාවයක් ගනී එනම් අතිශයෝක්තියෙන් යුක්ත නිරූපණයකි.චලනයන් තුළද යම්කිසි රිද්මයානුකූල භාවයදක්නට ලැබේ.අභිරූපන රංගයක් සඳහා තෝරාගන්නා සිද්ධිය නාට්‍යයමය ගුණයෙන් යුක්ත විය යුතු අතර සාමාන්‍යයෙන් අභිරූපණ රංග යක් විනාඩි 5ත් 10ත් අතර කාල සීමාවකට සීමා කර ගතයුතු වේ.

අභිරූපනය සඳහා යොදා ගන්නා අංග රචනය ද සුවිශේෂී භාවයක් ගනී විශේෂයෙන් මුහුණ රචනය කරන්නේ මුහුණේ උපාංග වඩාත් හොඳින් ඉස්මතු වන අන්දමටයි..මුහුනෙ ස්වභාවික ඉරියව් හොඳින් ඈතට දිස්වෙන පරිදි සුදු ආලේපන ආලේපනය ප්‍රධාන වශයෙන් භාවිතා කරන අතර ඇස් දෙක ඇහි ඇහිබැම කට නාසය මතුවන ආකාරයට ත්,තොල් වල රතු ආලේපන යත් ඇහි බැම් වල හා ඇස් වල කළු හරණයක් භාවිතා කරමින් අංග රචනය සිදු කරයි .



භාවිත කරනු ලබන ඇඳුම් වල ස්වභාවය ද වර්ණයද ශිල්පියා වඩාත් කැපී පෙනීමට හේතු වන අයුරින් යොදා ගනී(බොහෝවිට යොදාගනු ලබන්නේ කළු සහ සුදු යන වර්ණ දෙකයි )මෙහිදී චරිතයේ ස්වභාවය අනුව ඇඳුම් භාවිතා නොකරන අතර ශරීර අංග මැනවින් ඉස්මතු වන අයුරින් ඇඳුම භාවිතා කරයි ඉදිරිපත් කරනු ලබන අභිරූපණ රංග ය වඩාත් තීව්‍ර කිරීමට සහ අර්ථවත් කිරීමට රංගනයට අදාළ ශබ්ද සහ නාදයන්(සංගීතය)ඇතැම් විට භාවිතා වේ.

අභිරූපන රංගනයේ තාත්විකත්වය ඉක්මවූ අතිශයෝක්තියක් ද චලන හා රිද්මයානුකූල භාවයකින් ද

යුක්ත වූ නිසා මෙවන් ආකාරයට ඉදිරිපත් කිරීම් සිදු කිරීම සඳහා වූ ශිල්ප ක්‍රම දක්නට ඇත.සාර්ථක අභිරූපණ රංගනයක් ඉදිරිපත් කිරීම සඳහා මේවා හොඳින් ප්‍රගුණ කළ යුතු වේ.

**උදා -:** සාමාන්‍යයෙන් අභිරූපන වල ඇවිද්දීම සිදුවන්නේ සාමාන්‍ය ආකාරයකට නොවේ අභිරූපනය පුහුණුවීමේදී ගමන් රටා කිහිපයක් ඇත.

- සැහැල්ලු ඉදිරි ගමන
- පැති ගමන
- දුෂ්කර ගමන
- ආපසු ගමන

එමෙන්ම අභිරූපන රංගය තුළ අප පුහුණු කළ යුතු තාක්ෂණික ක්‍රමයට අනුගත වූ අවස්ථා කිහිපයක් යොදා ගනී ඒවා ලෝකයේ අනෙකුත් රටවල පවා ඒ ආකාරයටම ආකාරයටම තාත්විකත්වය රඳවා ගනිමින් ප්‍රේක්ෂකයා ඉදිරියේ මායාවත් සමග අපූර්වත්වයක් කිරීමට සමත් වෙයි .

- පඩි පේළියක් නගින ආකාරය
- පඩි පේළියක් බසින ආකාරය
- ඉනිමග ගැන අදින ආකාරය සහ බසින ආකාරය
- කඹයක් ආධාරයෙන් උඩට නැගීම සහ පාත්ලට බැසීම
- තිරස් පැත්තට දෙපිරිසක් අතර කඹයක් හැදීම
- වීදුරුවක් පිසීම
- අශ්වයකු පදවාගෙන යාම

කෙසේ ගෙඩියක් අනුභව කරන ආකාරය .

ප්‍රකට අභිරූපන ශිල්පින් ලෙස,

මාෂල් මාලෝ,සාලමනන් ෆොන්සේකා,විමල් කුමාර ද කොස්තා, ජයන්තා රණවක,සැනට් දික්කුඹුර ,මහේන්ද්‍ර පෙරේරා

**පැවරුම් - :**

- අභිරූපන අවස්ථාවන් සහිත වීඩියෝ පට නරඹන්න .
- අභිරූපනය යන්න කෙටියෙන් හඳුන්වන්න.
- අභිරූපන යෙදී භාවිතා නොවන අභිනය කුමක්ද?
- අභිරූපන යොදා ගන්නා ගමන් රටා මොනවාද ?
- අභිරූපන යෙදී භාවිතා කරන අංග රචනය සහ රචනය සහරංග වස්ත්‍ර පිළිබඳ කෙටි